දැන්වීමයි.

පහත සඳහන් තනතුරු සඳහා දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවකයින් ලියාපදිංචි කර සේවයේ යෙදවීම.- කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

පහත සඳහන් සුදුසුකම් ඇති පුද්ගලයන් අදාළ තනතුරු සඳහා දෛනික වැටුප් ගෙවීමේ පදනමින් ලියාපදිංචි කර සේවයේ යෙදවීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

- **ලියාපදිංචි කර සේවයේ යෙදවීමට යෝජිත තනතුරු සංඛ්‍යාව**

වැඩ/ක්ෂේත්‍ර කම්කරු - 05
සෞඛ්‍ය කම්කරු - 02

ලියාපදිංචි කර සේවයේ යෙදවීම සඳහා සුදුසුකම් පහතින් සඳහන් කෙරේ.

අනු අංකය	තනතුර හා දීමනා සහිත දෛනික වැටුප	අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්	පොදු සුදුසුකම්
01	වැඩ/ක්ෂේත්‍ර කම්කරු රු. 1926.66	08 ශ්‍රේණිය සමත්ව(09 වසර සමත්ව තිබීම)	➢ අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය. ➢ අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතු අතර අයදුම්පත් කැඳවන අවසාන දිනට දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ පූර්වාසන්න වසර 05 ක අනුගාමී වසර 03 තුළ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය. ➢ කරන්දෙණිය බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ. ➢ අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය. ➢ දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවකු හෝ රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබුවකු නොවිය යුතුය. ➢ අයදුම්කරුවන් අදාළ තනතුර සඳහා සඳහන් වී ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.
02	සෞඛ්‍ය කම්කරු රු.1926.66	08 ශ්‍රේණිය සමත්ව(09 වසර සමත්ව තිබීම)	

සුදුසුකම් සපුරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගනු ලබන අතර, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිභාර අරමුදලට ද හිමිකම් කියනු ලැබේ. මෙම තනතුරු සේවා අවශ්‍යතාවය මත සේවා ලබා ගැනීමක් වන අතර, තනතුරු සඳහා බඳවා ගැනීමක් නොවන බව හා මෙම සේවයේ යෙදවීම රජයේ හෝ පළාත් පාලන ආයතනවල ස්ථිර තනතුරු ලැබීමට සුදුසුකමක් ද නොවන බව සැලකිය යුතුය.

අදාළ අයදුම්පත් කැඳවා ලියාපදිංචි කරන සේවකයින් ලියාපදිංචි කර ඇති ලේඛණය පදනම්ව 2025.12.31 දින දක්වා සේවයේ යොදවන අතර, එදිනෙන් පසු ලියාපදිංචිය දීර්ඝ කිරීම සම්බන්ධව කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ තීරණ අනුව සිදු කරනු ලැබේ.

- **පොදු කොන්දේසි:-**

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම සංශෝධනය හෝ අවලංගු කිරීමේ බලය කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමන් සතුය.

- **අයදුම්පත් එවිය යුතු ආකාරය:-**

ඔබ විසින් සකසන ලද අයදුම්පත්‍රයක් අතින් හෝ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලියවිලිවල පිටපත් සමඟ අප වෙත යොමු කළ යුතුය.

I. ජාතික හැඳුනුම්පතේ පිටපතක්
II. උප්පැන්න සහතිකය
III. පදිංචිය සනාථ කිරීමේ ග්‍රාම නිලධාරි විසින් මාස 06 ක් තුල දී නිකුත් කරන ලද සහතිකය
IV. මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්
V. අධ්‍යාපන සහතිකවල පිටපත්
VI. වෘත්තීය හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය:- 2025.12.01

ආර්.එච්.සමන් කුමාර රණසිංහ,
සභාපති,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

ආර්.එච්. සමන් කුමාර රණසිංහ
සභාපති
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව